............ Proof

(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 34.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0158/'09

1.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව මහවැලි නව සංවර්ධන කලාපය තුළ 2004 සිට 2009.03.31 දක්වා වාර්ෂිකව ලබාදුන් බිම් කට්ටි සංඛ්‍යාව;

(ii) ඉඩම්ලාභීන් තෝරාගත් නිර්ණායක හා ලබාදුන් සම්පූර්ණ බිම් ප්‍රමාණය ගොඩ/වාරි වශයෙන් වෙන් වෙන්ව;

(iii) සුදුසුකම් සපුරා තිබියදීත් ඉඩම් ලබාදීමට නොහැකිවූ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ව්‍යාපාර වෙනුවෙන් සමාගම් හෝ වෙනත් ආයතනවලට ඉඩම් ලබාදී තිබේද;

(ii) එසේනම්, අයදුම් කරන ලද සමාගමේ/ආයතනයේ ප්‍රධානියාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) එම ඉඩම් ලබාදීමට තිබිය යුතු සුදුසුකම් හා නිර්ණායක, ඉඩම් ලබාදුන් දිනය සහ ලබාදුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ලබාදුන් ඉඩම් යොදාගත් කාර්යය හා ඒ කවර කාලසීමාවක් සඳහාද;

(v) එම ඉඩම් නිශ්චිත කටයුතු සඳහා යොදවා තිබේද;

(vi) එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එක් එක් ඉඩමට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2009.03.31 දිනට බෙදාදීමට ඉතිරිව ඇති බිම් ප්‍රමාණය (ගොඩ/වාරි) කොපමණද;

(ii) අනිවාර්යයෙන්ම ඉඩම් ලබාදිය යුතු අය හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ප්‍රමාණය කොපමණද;

(iv) කවර කාලසීමාවක් තුළ ඔවුන්ට ඉඩම් ලබාදෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0459/'09

2.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල වගකීමක් ඇති වෘත්තියක් වන රියදුරන් සඳහා වූ බලපත්‍රය නිකුත් කිරීමේදී එය සුපරීක්ෂාවෙන් සිදුකළ යුතු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රියදුරු බලපත්‍රයක් නිෂ්පාදනය කිරීමේ ටෙන්ඩරය භාරදීමේදී අදාළ සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විමසිලිමත්විය යුතු බවත්;

(ii) නව රියදුරු බලපත්‍රය නිෂ්පාදනය කිරීමේ ටෙන්ඩරය භාර දී තිබෙන සමාගමේ ප්‍රධානියා, මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් දකුණු අප්‍රිකාවේ අධිකරණයකින් වසර 15ක සිර දඬුවමකට ලක් වූ පුද්ගලයෙක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0482/'09

3.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 වසර තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් රජයේ වියදමින් විදේශ සංචාර සඳහා සහභාගී වූයේද;

(ii) එසේ නම්, ඒ කවර රටවලටද;

(iii) එසේ සහභාගි වූයේ කවර අරමුණක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සහභාගී වූ නිලධාරීන්ගේ නම් හා වයස වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එම සංචාර සඳහා දරන ලද මුළු වියදම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'09

4.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 19 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) සඳහන්, "සමෘද්ධි සහන" වැඩ සටහන් යටතේ යෝජනා කර ඇති පරිදි, වයෝවෘද්ධ, ආබාධිත පවුල් සඳහා රුපියල් 3000 ක මාසික දීමනාවක් ලබාදීම යටතේ 2006, 2007 සහ 2008 වර්ෂවලදී මහනුවර දිස්ත්‍රික්කයේ වයෝවෘද්ධ, ආබාධිත වූ අය කොපමණ සංඛ්‍යාවක් එම ව්‍යාපෘතියට ඇතුළත් කරගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2006, 2007 සහ 2008 වර්ෂවලදී එසේ හඳුනාගත් මහනුවර දිස්ත්‍රික්කයේ වයෝවෘද්ධ, ආබාධිත පවුල් සඳහා මාසිකව රුපියල් 3000 ක මුදල ලබා දීම ක්‍රියාත්මක පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0627/'09

5.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1980 ජූලි වැඩ වර්ජනයට සම්බන්ධ වූ පේෂ කර්මාන්ත සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එවකට සිටි කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍යතුමා අංක 06/1540/230/039 හා 2006.08.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණය මත අමාත්‍ය මණ්ඩලය එම පත්‍රිකාව අනුමත කරමින් අදාළ ගෙවීම් කරන ලෙස කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශයට (පෙර, කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති) උපදෙස් දී ඇති බව එතුමා දන්නේද?

(ඇ) ඒ අනුව, 2006 දෙසැම්බර් මස මුල් භාගයේදී ගෙවීම් කරන බවට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නිවැරදි හිමිකරුවන් හඳුනාගෙන ගෙවීම් කිරීම පිණිස, හිඟ වැටුප සඳහන් විශේෂ දිවුරුම් ප්‍රකාශ නිකුත් කර ඇති බව එතුමා පිළිගන්නේද?

(ඈ) (i) එසේ වැටුප් ගෙවීමට ඇති දිවුරුම් ප්‍රකාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඉ) (i) ඒ අනුව, අදාළ පේෂකර්ම සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0628/’09

6. ගරු රංජිත් අලුවිහාරේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාතලේ, මන්දණ්ඩාවෙල, පන්සල පාරේ අංක 20/10 දරන කම්කරු නිවාසවල වසර 50 කට ආසන්න කාලයක් පදිංචි පවුල් 03කට එම නිවාස වලින් ඉවත්වන ලෙසට නියෝග කර ඇති බව එතුමා දන්නේද?

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරුවන් ලෙස සේවය කළ මොවුන් පසුගිය කාලය තුළ තම වියදමින් නිවාස අලුත්වැඩියා කර, ජලය හා විදුලියද ලබාගෙන ඇති අතර ඡන්ද නාම ලේඛන හා අනිකුත් බිල්පත්ද ගෙවා ඇති බවත් එතුමා පිළිගන්නේද?

(ඇ) මෙම අයට සාධාරණය ඉටුකර තවදුරටත් මෙම නිවාසවල පදිංචියට ඉඩ ලබාදෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0689/’09

7. ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ දක්වා වූ පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා දුම්රිය සේවය ලැබූ ලාභය / පාඩුව කොපමණද;

(ii) පසුගිය වසර පහක කාලය තුළ ස්ථිර සහ අනියම් පදනමින් සේවය කළ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) දුම්රිය ගාස්තු වැඩි කරනු ලැබූ දිනයන් කවරේද;

(ii) ආදායම සහ පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) 2002 සිට 2008 දක්වා සහ 2009 වසරේ මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0704/'09

8.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂය සඳහා නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන් වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම වෙන් කරන ලද මුදලින් අම්පාර දිස්ත්‍රික්කය වෙනුවෙන් කොපමණ මුදලක් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වෙන් කරන ලද මුදලින් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'09

9.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0172/'09

10.

ගරු විජිත රණවීර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එම්. එම්. සුමනාවතී මහත්මිය මාතර, දීයගහ බටහිර මහා විද්‍යාලයේ විදුහල්පතිනිය ලෙස සේවය කර 1991.01.01 දින සිට විශ්‍රාම ගොස් ඇති බවත්;

(ii) 1988.01.01 දින සිට කුසලතාවය හා ජ්‍යෙෂ්ඨතාවය මත ඇයට විදුහල්පති II ශ්‍රේණියට උසස්වීම් ලබාදිය යුතු බවත්;

(iii) එහෙත් ඇය විශ්‍රාම යන තෙක්ම අදාළ උසස්වීම ලබා නොදුන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විශ්‍රාම ගොස් ගතවූ වසර 18 තුළ සුමනාවතී මහත්මියගේ උසස්වීම සහ විශ්‍රාම වැටුප සකස්කර ගැනීමට ගනුලැබූ උත්සාහය සාර්ථක නොවූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත උසස්වීම සහ විශ්‍රාම වැටුප සකස්කර නොදෙන්නේ කවර හේතු නිසාද;

(ii) සියලු සුදුසුකම් සපුරා ඇති සුමනාවතී මහත්මියට අදාළ උසස්වීම ලබාදී, විශ්‍රාම වැටුප සකස්කර දෙනු ලබන්නේ කවදාද;

(iii) වයස අවුරුදු 78 ක් වන ඇයට අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා උසස්වීමත් ඊට නියමිත විශ්‍රාම වැටුපත් නොලැබුණු කාලයට වන්දි මුදලක් හෝ වෙනත් දීමනාවක් ලබාදෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0460/09

11.
ගරු ජේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (කාර්මික) තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) එලෙස සංශෝධනය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සංශෝධනයට අනුව උක්ත තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ උසස් කිරීමේ පරිපාටියක් බවත්;

(ii) උසස් කිරීමේ පරිපාටියක් නම් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ, 2.4 සහ 2.5 වගන්තිවලට අනුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් අමාත්‍යාංශ ලේකම් හරහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගත යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, අදාළ අමාත්‍ය මණ්ඩල අනුමතිය ගත්තේද;

(ii) ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) අදාළ අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා නොගත්තේ නම්, බඳවා ගැනීමේ පටිපාටිය නීති විරෝධී බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) එසේ නම්, ඊට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0690/'09

12.
ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ දක්වා වූ පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (ශ්‍රී. ලං. ම. ග. ම) ලැබූ ලාභය / පාඩුව කොපමණද;

(ii) පසුගිය වසර පහක කාලය තුළ ස්ථිර සහ අනියම් පදනමින් සේවය කළ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) බස් ගාස්තු වැඩි කරනු ලැබූ දිනයන් කවරේද;

(ii) ආදායම සහ පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2002 සිට 2008 දක්වා සහ 2009 වසරේ මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0177/09

13.
ගරු විජිත රණවීර මහතා,—පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ අශ්වබල 03 ට අඩු බහුකාර්ය යන්ත්‍ර උපයෝගී කරගනිමින් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි වඩුමඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම, ලිපිනය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අදාළ ප්‍රාදේශීය සභාව, ලියාපදිංචි අංකය, ව්‍යාපාරයේ ස්වභාවය, ආරම්භ කළ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අශ්වබල 03ට අඩු බහුකාර්ය යන්ත්‍ර යොදා රැකියාවල නිරතවන වඩු කාර්මිකයන් සියලු දෙනා පරිසර බලපත්‍ර වාර්ෂිකව ලබාගත යුතුද;

(iv) පරිසර බලපත්‍රයක් ලබාගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙළ හා වැයකළ යුතු සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අශ්වබල 03 ට අඩු බහුකාර්ය යන්ත්‍ර සඳහා පාරිසරික බද්දක් අයකිරීම ආරම්භ කළේ කවදා සිටද;

(ii) 2008 සහ 2009 වර්ෂ සඳහා එම බදු මුදල ගෙවන ලද සංඛ්‍යාව කොපමණද;

(iii) වඩු කාර්මිකයින්ට විශාල වැයබරක් වන මෙම බදු මුදල අහෝසි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0461/'09

14.
ගරු පේමසිරි මානගේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාපරිපාටිය කවරේද;

(iii) එම බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලබන්නේද;

(iv) එසේනම්, ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ග්‍රාම නිලධාරි තනතුරු සඳහා පැවැති තරඟ විභාගයේදී ඉහළ ලකුණු ලබාගත් අය බඳවා ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර පහක කාලය තුළ —

(i) මෙරටට ආනයනය කරන ලද, දේශියව වගා කරනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන වර්ග දහයක නම් කවරේද;

(ii) එම එක් එක් නිෂ්පාදනයෙන් කොපමණ ප්‍රමාණයක් වාර්ෂිකව ආනයනය කරනු ලැබුවේද;

(iii) රට තුළ වගා කරනු ලබන ප්‍රමාණයද ඇතුළුව එම නිෂ්පාදනවල දේශීය පරිභෝජනය කොපමණද;

(iv) මෙම නිෂ්පාදන මත පනවා ඇති බදු ප්‍රමාණය කොපමණද;

(v) දේශීයව එම නිෂ්පාදන වැඩි වශයෙන් වගා නොකිරීමට හේතුව කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට පොහොර සහනාධාරය ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එක් එක් නිෂ්පාදනය සඳහා එක් එක් වර්ෂයේදී ලබා දී ඇති පොහොර ටොන් ප්‍රමාණය කොපමණද;

(iii) මේ වන විට වගා කිරීම සඳහා දිරිමත් කරනු ලබන්නාවූ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන පහක් මොනවාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

කම්කරු සහ මිනිස් බල අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන),— 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම පැවැත්වෙන කාලවේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතුය. අ. භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතුය.

3.

ගරු කබීර් හෂීම් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"අල්-ජාමිඅතුල් ඉස්ලාමියියා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු ආර්. එම්. රංජිත් මද්දුමබණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"ලක් දෙරණ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 103— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන පන්සිය හැත්තෑවකුත්, ලක්ෂ අටකට (රු. 570,800,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 103 | — | රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 02 | — | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා |
| | 03 | — | රාජ්‍ය බුද්ධි සේවාව |
| | 04 | — | ජාතික ශිෂ්‍යභට බලකාය |

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 550,000,000 |
| ප්‍රාග්ධන වියදම් | රු. 20,800,000 |
| එකතුව | රු. 570,800,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 16 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 15 දක්වා එකතුව රු. 30,373,403,938.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 222— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහනව දහස් හයසිය අසූ එකකට (රු. 19,681,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 222 | — | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 01 | — | සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා |
| | 02 | — | න්‍යායික |
| | 03 | — | ක්‍රියාන්විත |
| | 04 | — | ස්වේච්ඡා බලකාය |

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. | 18,900,000,000 |
| ප්‍රාග්ධන වියදම් | රු. | 781,000,000 |
| එකතුව | රු. | 19,681,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 17 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 16 දක්වා එකතුව රු. 30,944,203,938.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 223— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන හත් දහස් තුන්සිය හැත්තෑ හතරකුත්, තුන් ලක්ෂයකට (රු. 7,374,300,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 223 | — | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 01 | — | සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා |
| | 02 | — | මුහුදුබඩ හමුදා කටයුතු |
| | 03 | — | සැපයීම, සංවිධාන, කාර්මික හා අනෙකුත් සහාය සේවා |
| | 04 | — | ස්වේච්ඡා බලකාය |

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. | 5,974,300,000 |
| ප්‍රාග්ධන වියදම් | රු. | 1,400,000,000 |
| එකතුව | රු. | 7,374,300,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 18 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 17 දක්වා එකතුව රු. 50,625,203,938.

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 224— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙදහස් නවසිය පනහකට (රු. 2,950,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 224 | — | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන | |
| ව්‍යාපෘතිය | 01 | — | සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා | |
| | පුනරාවර්තන වියදම් | | රු. | 200,000,000 |
| | ප්‍රාග්ධන වියදම් | | රු. | — |
| | එකතුව | | රු. | 200,000,000 |
| ව්‍යාපෘතිය | 02 | — | ගුවන් ගොඩබිම් සහ යුද්ධමය නොවන මෙහෙයුම් කටයුතු | |
| | පුනරාවර්තන වියදම් | | රු. | 1,150,000,000 |
| | ප්‍රාග්ධන වියදම | | රු. | 300,000,000 |
| | එකතුව | | රු. | 1,450,000,000 |
| ව්‍යාපෘතිය | 03 | — | ඉංජිනේරු සහ සැපයීම් සේවා | |
| | පුනරාවර්තන වියදම් | | රු. | 925,000,000 |
| | ප්‍රාග්ධන වියදම | | රු. | 375,000,000 |
| | එකතුව | | රු. | 1,300,000,000 |
| | මුළු එකතුව | | රු. | 2,950,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 19 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 18 දක්වා එකතුව රු. 57,999,503,938.

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 225— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හයසිය හතළිහක් (රු. 1,640,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 225 | — | පොලිස් දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 02 | — | නීතිය බලාත්මක කිරීම |
| පුනරාවර්තන වියදම් | | රු. | 1,640,000,000 |
| | | රු. | 1,640,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 20 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 19 දක්වා එකතුව රු. 60,949,503,938.

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 320— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හයසිය තිහකුත්, පන්ලක්ෂයකට (රු. 1,630,500,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 320 | — | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් ක්‍රියාකාරකම් |
| ව්‍යාපෘතිය | 01 | — | ග්‍රාමාරක්ෂක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම |
| පුනරාවර්තන වියදම් | | රු. | 1,500,500,000 |
| ප්‍රාග්ධන වියදම් | | රු. | 130,000,000 |
| එකතුව | | රු. | 1,630,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 21 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 20 දක්වා එකතුව රු. 62,589,503,938.

7.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

8.

පුලතිසි දරුවෝ පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

9.

සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

10.

හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

11.

මාළිගාවත්ත ජනාසා සහ සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

12.

ග්‍රාමීය සේවක සහ අනුබද්ධිත ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

13.

ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

14.

සමාජ සහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

15.

ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

*16.

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 123— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හත්සිය පහළොවකට (රු. 1,715,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 123 | — | නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් | |
| | ප්‍රාග්ධන වියදම් | | රු. | 1,715,000,000 |
| | | | රු. | 1,715,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 සැප්තැම්බර් මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 14 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 13 දක්වා එකතුව රු. 20,780,903,938.

*17.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 105— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හත්සිය අසූහත් කෝටි හැත්තෑ පන් ලක්ෂයකට (රු. 7,877,500,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 105 | — | ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් |
| ව්‍යාපෘතිය | 10 | — | විදේශාධාර සංවර්ධන ව්‍යාපෘති |
| ප්‍රාග්ධන වියදම් | | | රු. 7,877,500,000 |
| | | | රු. 7,877,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 15 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 14 දක්වා එකතුව රු. 22,495,903,938.

*18.

ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 166— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙදහස් එකසිය හතලිස් පහකට (රු. 2,145,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 166 | — | ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන ක්‍රියාකාරකම් |
| ව්‍යාපෘතිය | 05 | — | මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය |
| උප ව්‍යාපෘතිය | 15 | — | ද්වීතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය |
| මූල්‍යකරණ අංක (විදේශාධාර ණය) | 12 | | |
| ප්‍රාග්ධන වියදම් | | | රු. 1,295,000,000 |
| මූල්‍යකරණ අංක (විදේශාධාර සබැඳි දේශීය අරමුදල්) | 17 | | |
| ප්‍රාග්ධන වියදම් | | | රු. 850,000,000 |
| එකතුව | | | රු. 2,145,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 22 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 21 දක්වා එකතුව රු. 64,220,003,938.

*19.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 117— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දස දහස් හයසිය හතලිස් එකකට (රු. 10,641,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 117 | — | මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් | |
| ව්‍යාපෘතිය | 03 | — | අධිවේගී මාර්ග සංවර්ධනය - (දේශීය අරමුදල්) | රු. 408,000,000 |
| | 04 | — | මහාමාර්ග සංවර්ධනය- (දේශීය හා විදේශීය අරමුදල්) | රු. 819,000,000 |
| | 05 | — | මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම-(දේශීය හා විදේශීය අරමුදල්) | රු. 1,610,000,000 |
| | 06 | — | පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම - (දේශීය හා විදේශීය අරමුදල්) | රු. 5,584,000,000 |
| | 07 | — | සුනාමියෙන් විපතට පත් මාර්ග පුනරුත්ථාපනය කිරීම - (දේශීය හා විදේශීය අරමුදල්) | රු. 2,005,000,000 |
| | 08 | — | ආයතනික සහාය - (දේශීය අරමුදල්) | රු. 215,000,000 |
| | | | එකතුව | රු.10,641,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 23 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 22 දක්වා එකතුව රු. 66,365,003,938.

*20.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*21.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*22.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*25.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*26.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*27.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*28.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*29.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*30.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*31.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*32.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*33.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*34.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*35.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*36.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*37.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*38.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*39.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*40.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*41.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*42.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*43.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ වූ නියෝග,— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 26 වගන්තිය සමග කියවිය යුතු 212 වගන්තිය යටතේ යම් පුද්ගලයෙකු යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද සම්බන්ධයෙන් වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූනි මස 19 දිනැති අංක 1606/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*44.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වූ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූනි මස 30 වැනි දිනැති අංක 1608/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*45.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*46.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විමසා සාදන ලදුව, 2009 සැප්තැම්බර් මස 03 වැනි දිනැති අංක 1617/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*47.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පාංශු සංරක්ෂණ පනත යටතේ නියෝග,— (450 වැනි අධිකාරය වූ) 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනතේ 4 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, පාංශු සංරක්ෂණ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වන 2009.10.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*48.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.26 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*49.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*50.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*51.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*52.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*53.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*54.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*55.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*56.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*57.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*58.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

59.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

60.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

61.
පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

62.
මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

63.
බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0732/'09

1.
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද ඌව පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0733/'09

2.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද උතුරු මැද පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0734/'09

3.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද මධ්‍යම පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0735/'09

4\.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද සබරගමුව පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0736/'09

5\.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද වයඹ පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0737/'09

6\.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද නැගෙනහිර පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?